# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

## අති විශෙෂ

අංක 2373/43 - 2024 මාර්තු මස 01 වැනි සිකුරාදා - 2024.03.01

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)

# I වැනි කොටස: (I) වැනි ඡෙදය - සාමාන්‍ය

## රජයේ නිවේදන

එල්. ඩී. බී. 4/2022

**1961 අංක 31 දරන ආයුර්වේද පනත**

1961 අංක 31 දරන ආයුර්වේද පනතේ 19(1)(අ) සහ (2) වගන්ති සමග කියවිය යුතු එකී පනතේ 49(1)(අ)(2) සහ (3) වගන්ති යටතේ ආයුර්වේද වෛද්‍ය සභාව විසින් සාදනු ලබන රීති.

සභාපති,
ආයුර්වේද වෛද්‍ය සභාව.

2024 පෙබරවාරි මස 07 වැනි දින,
කොළඹ දී ය.

රීති

1. මෙහි රීති 2023 අංක 01 දරන ආයුර්වේද නිලධරයන් සහ සේවකයන් (සේවා කොන්දේසි) පිළිබඳ රීති යනුවෙන් හඳුන්වනු ලැබේ.

**ආයුර්වේද වෛද්‍ය සභාවේ ලේඛකාධිකාරිවරයා**

2. මෙහි මින්මතු "සභාව" යනුවෙන් සඳහන් කරනු ලබන ආයුර්වේද වෛද්‍ය සභාව විසින් පනතේ 19(1)(අ) වගන්තිය යටතේ සභාවේ ලේඛකාධිකාරිවරයා ලෙස පත්කරනු ලබන තැනැත්තා -

   (අ) ශ්‍රී ලංකාවේ පුරවැසියකු විය යුතුය,

   (ආ) සභාව වෙත ලියාපදිංචි වූ ආයුර්වේද වෛද්‍යවරයෙකු විය යුතුය.

   (ඇ) 1978 අංක 16 දරන විශ්වවිද්‍යාල පනත යටතේ පිළිගත් විශ්වවිද්‍යාලයක් හෝ අනුබද්ධ ආයතනයක් විසින් ප්‍රදානය කළ -

      (i) ආයුර්වේද වෛද්‍ය හා ශල්‍ය වෛද්‍යවේදී උපාධියක් (BAMS);

      (ii) සිද්ධ වෛද්‍ය හා ශල්‍යවේදී උපාධියක් (BSMS);

1A - PG 6661 — 05 (2024/03)
*මෙම අති විශෙෂ ගැසට් පත්‍රය www.documents.gov.lk වෙබ් අඩවියෙන් බාගත කළ හැක.*

(iii) යුනානි වෛද්‍ය හා ශල්‍යවේදී උපාධියක් (BUMS);

(iv) සිද්ධ ආයුර්වේද වෛද්‍ය හා ශල්‍යවේදී ඩිප්ලෝමාවන් (DSAMS); හෝ

(v) සිද්ධ ආයුර්වේද ඩිප්ලෝමා සහතිකයක් (DSAC),

සතු තැනැත්තෙකු විය යුතුය.

(ඈ) රාජ්‍ය සේවයේ හෝ 1978 අංක 16 දරන විශ්වවිද්‍යාල පනත යටතේ පිළිගත් වෙනත් සේවයක සේවා නියුක්ත ආයුර්වේද වෛද්‍යවරයකු විය යතුය.

(ඉ) එකී සේවයේ අවුරුදු පහළොවක පසු සුදුසුකම් පළපුරුද්දක් තිබිය යුතුය.

(ඊ) සිංහල සහ දෙමළ භාෂාවල මනා පරිචයක් පැවතිය යුතු අතර ඉංග්‍රීසි භාෂා පරිචය අතිරේක සුදුසුකමක් වනු ඇත.

(උ) තනතුරට පත්කරනු ලැබීමේ දිනට වයස අවුරුදු හතලිස් පහට නොඅඩු සහ හැටට නොවැඩි විය යුතු ය.

3. 2 වන රීතියේ සඳහන් පරිදි යටතේ ලේඛකාධිකාරීවරයා ලෙස පත් කරනු ලබන තැනැත්තා මනා චරිතයකින් යුතු විය යුතු අතර, පූර්වාසන්න පස් වසරක සතුටුදායක සේවා කාලයක් සහිත තැනැත්තකු විය යුතු ය.

4. සභාවේ ලේඛකාධිකාරීවරයා-

(අ) සභාවේ කටයුතුවලට ප්‍රතිවිරුද්ධ සම්බන්ධතාවක් නොමැති විය යුතු ය;

(ආ) ආයුර්වේද වෛද්‍යවරුන් පුහුණු කිරීමෙහි නියුතු යම් පෞද්ගලික ආයතනයක් මෙහෙයවීම හෝ මෙහෙයවීමට සම්බන්ධ වී සිටීම නොකළ යුතු ය;

(ඇ) ආයුර්වේද ඖෂධ නිෂ්පාදනය, අළෙවිකරණය හෝ බෙදාහැරීමේ ව්‍යාපාරයක තමාම හෝ වෙනත් යම් තැනැත්තකු සමග එක්ව නිරතව නොසිටිය යුතු ය;

(ඈ) යම් ආයුර්වේද ඖෂධයක් බෙදාහැරීමේ ව්‍යාපාරයක හෝ එවැනි ව්‍යාපාරයක් ප්‍රවර්ධනය කරන යම් ක්‍රියාකාරකමක නිරතව සිටින යම් දේශීය හෝ විදේශීය සමාගමක උපදේශකවරයකු ලෙස සේවය නොකළ යුතු ය;

(ඉ) යම් අධිකරණයක් විසින් සාපරාධී වරදකට වරදකරු කරනු ලැබ නොසිටිය යුතු ය; හෝ

(ඊ) සභාව විසින් යම් වෘත්තීමය වරදකට වරදකරු කරනු ලැබූ තැනැත්තකු නොවිය යුතු ය.

5. ලේඛකාධිකාරීවරයාගේ කාර්ය හා කර්තව්‍ය විය යුත්තේ-

(අ) සභවේ ලේකම්වරයා ලෙස කටයුතු කිරීම;

(ආ) පාරම්පරික ආයුර්වේද වෛද්‍යවරුන් ලියාපදිංචි කිරීම හා සම්බන්ධ ලිඛිත හා වාචික පරීක්ෂණ පැවැත්වීම ද ඇතුළුව සභාවේ කටයුතු කළමනාකරණය කිරීම;

(ඇ) සභාව වෙනුවෙන් සියලු ලිපි ගනුදෙනු කටයුතු පවත්වාගෙන යාම;

(ඈ) සභාවේ මූල්‍ය කටයුතු සම්බන්ධයෙන් සහාය වීම;

(ඉ) සභාවේ මුද්‍රාව දැරීම සහ තබාගැනීම;

(ඊ) පනතේ විධිවිධාන ප්‍රකාරව ආයුර්වේද වෛද්‍යවරුන්ගේ, අයුර්වේද ඖෂධවේදීන්ගේ සහ ආයුර්වේද හෙද සේවකයන්ගේ නාමලේඛන පවත්වාගෙන යාම;

(උ) සභාවේ රැස්වීම් කැඳවීම සහ එවැනි රැස්වීම්වල කටයුතු වාර්තාගත කිරීම හා ඒ පිළිබඳ සටහන් පවත්වාගෙන යාම;

(ඌ) ලියාපදිංචි ආයුර්වේද වෛද්‍යවරුන්ගේ විනය කටයුතු සම්බන්ධයෙන් සභාවේ තීරණය ඔවුන් හට දැන්වීම සහ එකී තීරණ ක්‍රියාත්මක කිරීම;

(එ) සභාවේ කාර්ය මණ්ඩලය කෙරෙහි පරිපාලනය සහ විනය පාලනය ක්‍රියාත්මක කිරීම; සහ

(ඒ) සභාවේ පරමාර්ථ හා කර්තව්‍ය වැඩිදියුණු කිරීමෙහිලා සභාවෙන් ඔහු වෙත පවරා ඇති කර්තව්‍ය ඉටු කිරීම,

විය යුතු ය.

6. (1) ලේඛකාධිකාරි තනතුර සඳහා වන අයදුම්පත් සිංහල, දෙමළ සහ ඉංග්‍රීසි භාෂාවලින් දෛනික පුවත්පතක පළ කරනු ලබන දැන්වීමක ආකාරයෙන් කැඳවිය යුතු ය.

(2) අදාළ තනතුරට වඩාත් යෝග්‍ය අපේක්ෂකයා තේරීම:-

(අ) සම්මුඛ පරීක්ෂණ මණ්ඩලයේ සභාපතිවරයා විය යුතු ආයුර්වේද වෛද්‍ය සභාවේ සභාපතිවරයා;

(ආ) ආයුර්වේද වෛද්‍ය සභාවේ සාමාජිකයන් අතරින් තෝරාගනු ලබන එකී සභාවේ සාමාජිකයන් දෙදෙනෙකු; සහ

(ඇ) සහකාර කොමසාරිස්වරයකුගේ නිලය දරන ආයුර්වේද දෙපාර්තමේන්තුවේ ජ්‍යෙෂ්ඨ නිලධරයකු,

සහ තැනැත්තන්ගෙන් සමන්විත වූ සම්මුඛ පරීක්ෂණ මණ්ඩලයක් විසින් පවත්වනු ලබන ව්‍යුහගත සම්මුඛ පරීක්ෂණයක් මගින් කළ යුතු ය.

(3) සම්මුඛ පරීක්ෂණ මණ්ඩලයේ ලේඛකාධිකාරිවරයා ලෙස පත් කිරීම සඳහා එම මණ්ඩලය විසින් සභාව වෙත අපේක්ෂකයකු නිර්දේශ කළ යුතු ය.

7. සම්මුඛ පරීක්ෂණ මණ්ඩලය විසින් නිර්දේශ කරනු ලැබුවා වූ අපේක්ෂකයා සභාව විසින් සභාවේ ලේඛකාධිකාරිවරයා ලෙස පත් කරනු ලැබිය යුතු අතර, එකී ලේඛකාධිකාරිවරයා අමාත්‍යවරයා විසින් නිශ්චය කරනු ලබන නියම හා කොන්දේසිවලට යටත් විය යුතු ය.

8. ලේඛකාධිකාරිවරයාගේ ධුර කාලය වසර තුනක් වන අතර දෙවන වාරයක් සඳහා නැවත පත් කරනු ලැබිය හැකිය.

9. ලේඛකාධිකාරිවරයාගේ ධුරය-

(අ) ඔහුට වයස අවුරුදු හැට පිරීමේ දී හෝ ධුර කාලය ඉකුත්වීමෙන්;

(ආ) ඔහු මියයාමෙන්;

(ඇ) සභාවේ සභාපතිවරයා ලිඛිතව අමතන ලියවිල්ලක් මගින් ඉල්ලා අස්වීමෙන්;

(ඈ) යුතුකම් ඇසීම පැහැර හැරීම හෝ බරපතල විෂමාචාරය හෝ අශක්නුතාව මත සභාව විසින් ධුරයෙන් ඉවත් කරනු ලැබීමෙන්; හෝ

(ඉ) ඔහු ධුරයෙන් ඉවත් කරනු ලැබීමට පක්ෂව සභාවේ සාමාජිකයන්ගෙන් තුනෙන් දෙකක බහුතරයකින් යුතුව සභාව විසින් යෝජනා සම්මතයක් සම්මත කරනු ලැබීමෙන්,

පුරප්පාඩු විය යුතු ය.

10. 9 වන රීතියේ නිශ්චිතව දක්වා ඇති කාරණා හේතුවෙන් ලේඛකාධිකාරී ධුරය පුරප්පාඩු වන අවස්ථාවක දී, පනතේ 19(1)(අ) වගන්තියේ විධිවිධාන යටතේ එකී පුරප්පාඩුව පිරවීමට තැනැත්තකු පත් කරන තෙක් ලේඛකාධිකාරී වශයෙන් කටයුතු කිරීම සඳහා සභාවේ යම් සාමාජිකයකු සභාව විසින් පත් කරනු ලැබිය යුතු ය.

11. සභාවේ ලේඛකාධිවරයා වෙත, මුදල් විෂයය භාර අමාත්‍යවරයාගේ එකඟත්වය ඇති ව අමාත්‍යවරයා විසින් වරින් වර නිශ්චය කරනු ලැබිය හැකි ආකාරයකින් පාරිශ්‍රමික ගෙවිය හැකි ය.

**ආයුර්වේද වෛද්‍ය සභාවේ නිලධරයන් සහ සේවකයන්**

12. සභාවේ නිලධරයන් සහ සේවකයන් පත්කිරීම හා ඔවුන්ගේ උසස්වීම්, සේවයෙන් පහකිරීම් සහ විනය පාලනය පිළිබඳ නිර්ණායක සභාව විසින් අදාළ තනතුරු සඳහා සකස්කරනු ලබන බඳවාගැනීමේ පටිපාටියට (SOR) අනුකූලව විය යුතු ය.

13. සභාවේ නිලධරයන් සහ සේවකයන් වෙත, අමාත්‍යවරයා විසින් මුදල් විෂයය භාර අමාත්‍යවරයාගේ එකඟත්වය ඇතිව වරින්වර නිශ්චය කරනු ලබන යම් ආකාරයකින් පාරිශ්‍රමික ගෙවනු ලැබිය හැකි ය.

14. මෙම රීතිවල කාර්යය සඳහා-

"ආයුර්වේද වෛද්‍යවරයා" යන්නෙන්, සභාව විසින් සභාවේ පොදු නාමලේඛනයේ හෝ විශේෂ නාමලේඛනයේ ආයුර්වේද වෛද්‍යවරයකු ලෙස තත්කාලයේ ලියාපදිංචිව සිටින ආයුර්වේද වෛද්‍යවරයකු අදහස් වේ;

"සභාව" යන්නෙන් 1961 අංක 31 දරන ආයුර්වේද පනතේ 11 වන වගන්තිය යටතේ පිහිටුවන ලද අයුර්වේද වෛද්‍ය සභාව අදහස් වේ.

EOG 03 - 0008

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.